# ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීමයි.
# තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව
# දේපළ බදු දීම - 2023 වර්ෂය

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත උප ලේඛනයෙහි දැක්වෙන වත්කම් 2023.01.01 දින සිට 2023.12.31දක්වා කාලයට බදු දීම සඳහා මා විසින් ලංසු කැඳවනු ලැබේ.

02. 2022.09.26 දින සිට 2022.10.13 දින තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත උප ලේඛනයේ සඳහන් ඇති දේපළ සඳහා ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල් හා ආපසු නොගෙවන ලංසු පෝරම් ගාස්තු ගෙවීමෙන් පසු ලංසු අයදුම්පත් හා ලංසු කොන්දේසිපත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගත හැක. (තමාගේ පුද්ගලික හැඳුනුම්පත සහ පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කරන අයට පමණක් පහත දැක්වෙන ගාස්තු අය කර නිකුත් කරනු ලැබේ.)

03. 2022.10.14 දින පෙ.ව. 10.00 දක්වා ලංසු අයදුම්පත් භාර ගන්නා අතර , එදිනම පෙ.ව. 10.30 ට ලංසුපත් විවෘත කිරීම තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කෙරේ.

04. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම් , ප්‍රාදේශීය සභාව , තිස්සමහාරාම යන ලිපිනයට ලංසුපත් භාර ගන්නා අවසාන දින නියමිත වේලාවට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

05. ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී මුල් පිටපත , අනු පිටපත යනුවෙන් වෙන් වෙන්ව සඳහන් කර ලිපි කවරවල බහා එම ලිපි කවර 02 එක් ලිපි කවරයක බහා ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ 2023 වර්ෂයේ ලංසු ඉදිරිපත් කිරීම යනුවෙන් සහ අයදුම්පත් ඉදිරිපත් කර ඇති දේපළෙහි නම සඳහන් කළ යුතුය. (එක් එක් දේපළ බදු ගැනීම සඳහා වෙන් වෙන්ව ලංසු අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.)

06. අසාධුගත ලේඛණයෙහි සිටින බදුකරුවන්ට ලංසුපත් නිකුත් නොකරනු ලබන අතර , ඕනෑම ලංසුපතක් භාර ගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතුය.

07. අවම ලන්සුවට අඩුවෙන් ඉදිරිපත් කරන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර , එසේම අයදුම්පත් ලබා ගෙන ලංසුපත් ඉදිරිපත් නොකරන අයගේ ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

08. මීට අමතරව ලංසු අයදුම්පත් ලබා දීමේ සිට රජය විසින් පනවනු ලබන සියලුම බදු මුදල් වලට යටත්ව ගෙවීම් කළ යුතුය.

09. වැඩි විස්තර කාර්යාල වේලාව තුලදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභා දූරකතන අංක 047-2237275 න් ලබා ගත හැක.

| අනු අංකය | බදු විෂයය | අවම ලන්සුව (රු) | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | පෝරම් ගාස්තුව (රු.ශත) |
|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | 1,644,000.00 | 50,000.00 | 5,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | 2,078,181.81 | 50,000.00 | 5,000.00 |
| 03 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 1,207,710.00 | 10,000.00 | 500.00 |
| 04 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 495,882.00 | 5,000.00 | 500.00 |
| 05 | කිරින්ද පූජා නගර පැරණි වැසිකිළිය සහ නව වැසිකිළිය | 108,000.00 | 3,000.00 | 500.00 |
| 06 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 165,700.00 | 2,000.00 | 500.00 |
| 07 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 137,910.00 | 3,000.00 | 500.00 |
| 08 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 15,250.00 | 1,000.00 | 500.00 |
| 09 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ පොල් එළදාව (පොල් ගස් 08) | 8,040.00 | 1,000.00 | 500.00 |
| 10 | දෙබරවැව ධීවර වෙළඳසැල | 120,000.00 | 1,000.00 | 500.00 |
| 11 | දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල | 162,000.00 | 1,000.00 | 500.00 |
| 12 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 3,168.00 | 1,000.00 | 500.00 |
| 13 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එළදාව (පොල් ගස් 07) | 2,250.00 | 1,000.00 | 500.00 |
| 14 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 3,900.00 | 1,000.00 | 500.00 |
| 15 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් එළදාව (පොල් ගස් 04) | 3,690.00 | 1,000.00 | 500.00 |

ඩබ්ලිව්.ජී. උපුල්,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.